ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UVP/BD/E/PS/HP/2020/24

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 ජුලි 17 දින.

ජාතික විගණන උප කාර්යාලය
මහා නගර සභාව
බදුල්ල.

සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (11)(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එෆ්.එම්.විජේරත්න
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත:- පළාත් පාලන කොමසාරිස්, ඌව පළාත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UVP/BD/E/PS/HP/2020/24 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 ජූලි 17 දින.

සභාපති
හපුතලේ ප්‍රාදේශීය සභාව.

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශිය සහ ණය සංවර්ධන අරමුදලේ ශේෂය ණය ශේෂය සනාථ කිරීමේ ලිපිය අනුව රු.7,573,439 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු.7,725,316 ක් ලෙසට රු.151,877 ක් වැඩියෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාල මුදල් පොත අනුව ශේෂය රු.461,192 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.329,266 ක් ලෙසට රු.131,926 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාල මුදල් පොත අනුව ශේෂය රු.274,456 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වල රු.374,456 ක් ලෙස ට රු.100,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමි ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.10,826,280 ක් වුවද උපලේඛන අනුව රු.9,977,903 ක් වූයෙන් රු.848,377 ක වෙනසක් නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි උසාවි දඩ රු.1,775,480 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.2,394,590 ක් ලෙසට රු.619,110 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සභාවට ලැබී තිබුණු රු.1,630,000 ක් ප්‍රාග්ධන ලැබීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව පරීක්ෂා කරන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

මාගේ මතය වන්නේ,

(අ) මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඇතුලත් බව

## 1.6 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා(මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 177 වගන්තිය | රු.5,000 ක් හෝ එය ඉක්මවන අවස්ථාවක කළ වැඩ හෝ සේවා ක්‍රියාත්මක කිරීම හෝ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළයුතු වුවද, රු.78,000 ක් වාහන අලුත්වැඩියා 03 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | සේවය කර ස්ථානමාරුවී ගිය,විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගත යුතු වුවද නිලධාරින්/සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.62,956 ක ණය මුදල් අය කරගෙන නොතිබුණි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් බදු කුලී තක්සේරු කර ගිවිසුම් වලට එළඹ සභාවේ ආදායම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වුවද, සභාවට අයත් කඩ කාමර 62 ක් තක්සේරු කිරිමකින් තොරව සභා තීරණයක් මත බාහිර පාර්ශවයන්ට බදු පදනම මත ලබාදී තිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 | මාස 06 කට වරක් හෝ කි.මි.25,000 කට වරක් වන අවස්ථා දෙකෙන් එක් අවස්ථාවක වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළයුතු වුවද, සභාවට අයත් වාහන 06 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,651,624 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,770,817 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,880,807ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| i. | වරිපනම් හා බදු | 922,073 | 2,244,511 | 1,497,442 | 1,669,142 | 213,586 | 1,556,511 | 856,906 | 913,192 |
| ii. | කුලී | 670,543 | 2,747,290 | 4,016,291 | - | 716,157 | 3,678,040 | 2,641,740 | 1,752,457 |
| iii | බලපත්‍ර ගාස්තු | - | 600,000 | 1,336,295 | - | - | 500,000 | 697,078 | - |
| iv. | වෙනත් ආදායම් | 15,169,605 | 11,694,250 | 14,971,839 | 11,892,016 | 8,505,007 | 9,338,500 | 13,645,524 | 4,197,984 |
| | එකතුව | 16,762,221 | 17,286,051 | 21,821,867 | 13,561,158 | 9,434,750 | 15,073,051 | 17,841,248 | 6,863,633 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 17,286,051 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 13,561,158 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 78 ක් විය.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතුව පැවති උසාවි දඩ රු.239,590 ක් සහ මුද්දර ගාස්තු රු. 8,685,194 ක් අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 11 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

එක්සත්ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්ව තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) වසර 03 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි ප්‍රාග්ධන ආධාර රු. 9,921,066 ක්, හිඟ හිටි වෙනත් ආදායම් රු. 389,983 ක්, හිඟහිටි වරිපනම් 1,123,853 ක් ,හිඟ අක්කර බදු 2,195 ක්, දඩ හා වරෙන්තු ගාස්තු රු.9,209 ක්, හිඟ කඩ කුලී රු. 139,300 ක් ,හිඟ ගව මස් කඩ කුලී රු.102,702 ක්, හිඟ පොල ගාස්තු රු. 55,620 ක්,හිඟ කඩ කුලී දඩ රු.12,780 ක් හා හිඟ වාහන බදු රු.955,299 ක් ලෙසට ලැබිය යුතු ආදායම් එකතුව රු.12,712,007 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි.

(ආ) වසර 03 කට අධික කාලයක සිට පැවත එන වියදම් ණය හිමි රු.827,852 ක්, කර්මාන්ත ණය හිමි රු.10,826,280 ක් හා නොගෙවූ වැටුප් හා වේතන රු.37,824 ක් ලෙසට ගෙවිය යුතු ශේෂ එකතුව රු.11,691,956 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් කාර්ය මණ්ඩල තනතුරක් අනුමත කරගෙන නොතිබුණි.

(ආ) <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව පුරප්පාඩු 11 ක් පුරවා නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 31සිට සියයට 2059 දක්වාද වියදම් විෂයයන් 01 ක සියයට 06 සිට සියයට 10 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක:DMA/01-2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් වත් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

එස්.එම්. විජේරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත:- පළාත් පාලන කොමසාරිස්, ඌව පළාත